# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

12

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## වැරදි නිවැරදි කිරීම

1. ගිණුම්කරණයේ වැරදි සිදුවිය හැකි අවස්ථා 4 ක් නම් කරන්න.
2. ගිණුම්කරණයේ සිදුවන වැරදි ශේෂ පිරික්සුමට බලපාන ආකාරය අනුව කොටස් දෙකකි. නම් කරන්න.
3. ශේෂ පිරික්සුමේ සමානත්වයට බල නොපාන වැරදි හතරක් නම් කරන්න.
4. ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරදි වර්ග 5 ක් ලියා දක්වන්න.
5. අවිනිශ්චිත ගිණුමක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
6. අවිනිශ්චිත ගිණුමක් විවෘත කිරීමේදී අනුගමනය කරන අදියර පිළිවෙළින් දක්වන්න.
7. පහත සඳහන් වැරදි ශේෂ පිරික්සුමේ සමානාත්මතාවයට බලපාන්නේද, නැද්ද යන්න දක්වන්න.

| අ.අ. | ගනුදෙනුව | බලපෑම |
|---|---|---|
| 1. | රු. 10 000 ක ණයට විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජර්නලයේ සටහන් නොවීම. | |
| 2. | රු.14 000 ක් වූ ගැනුම් ඉන්වොයිසියක් රු. 4 000 ලෙස ගැනුම් ජර්නලයේ ලියවීම. | |
| 3. | රු. 7 000 ක වැටුප් ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම. | |
| 4. | රු. 6 000 ක යන්ත්‍ර අළුත්වැඩියා වියදම යන්ත්‍ර ගිණුමේ සටහන් වීම. | |
| 5. | රු. 15 000 ක් වූ වැටුප් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් නොවීම. | |
| 6. | රක්ෂණ ගාස්තු ගිණුමේ එකතුව රු. 10 000 ක් අඩුවෙන් සටහන් කිරීම. | |
| 7. | රු. 24 000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම. | |
| 8. | රු. 15 000 ක අත්පිට විකුණුම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමේ රු. 5 000 ක් ලෙස සටහන් කිරීම. | |
| 9. | ණයගැතියෙකුගෙන් ලැබුණ රු. 8 000 ක මුදල මුදල් පොතට හා ණයගැති ගිණුමට ද හර කිරීම. | |
| 10. | ලැබූ පොළී ගිණුමේ ශේෂය වූ රු. 4 000 ක් ශේෂ පිරික්සුමේ හර පැත්තේ සටහන් කිරීම. | |
| 11. | දුන් වට්ටම් 600ක් ලද වට්ටම් ලෙස සලකා ලද වට්ටම් ගිණුමට බැර කිරීම. | |
| 12. | ගෙවල් කුලී ගිණුමේ හරට ගෙන ආයුතු රු. 4 000 ක හර ශේෂය වැරදීමකින් බැර පැත්තෙන් ඉදිරියට ගෙන ඒම. | |
| 13. | ගැනිලි ගිණුමේ එකතුව රු. 4 000ක් අඩුවෙන් එකතු කිරීම. | |
| 14. | ලද කොමිස් රු. 5 000 ක්, දුන් කොමිස් ගිණුමට හර කිරීම. | |
| 15. | ණයහිමියෙකුට ගෙවූ රු. 7 000 ක මුදල ණයහිමි ගිණුමට බැර කිරීම. | |
| 16. | ගෙවූ දුරකථන ගාස්තු රු. 700 දුරකථන ගාස්තු ගිණුමේ සටහන් නොවීම. | |
| 17. | විකුණුම් ජර්නලයේ එකතුව රු. 8 000 ක් අඩුවීම. | |
| 18. | බැංකු ණය පොළී ගෙවීම වූ රු. 3 000 ක් බැංකු ණය ගිණුම හර වීම. | |
| 19. | විකුණුම් ගිණුමේ බැර පැත්ත රු. 1 000 ක් අඩුවීම. | |
| 20. | ණයගැතියෙකුගෙන් ලද රු. 15 000 ක මුදල අදාළ ණයගැති ගිණුමට හර කිරීම. | |

8. ලක්ෂිකාගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව බැර තීරුවේ එකතුවට සමාන නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී.
වෙනසට බලපෑ හේතු පහත දැක්වේ.

   I. රු. 5 000 ක ගැනුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වල වාර්තා වී නැත.
   II. රු. 5 000 ක වැටුප් ගෙවීම වැටුප් ගිණුමේ සටහන් වී නැත.
   III. ණයගැතියන්ගෙන් ලද රු. 9 000 ක මුදල මුදල්පොතේ පමණක් සටහන් වී ඇත.
   IV. විකුණුම් ජර්නලයේ එකතුව රු. 6 000 ක් අඩුවෙන් සටහන් වී ඇත.
   V. යන්ත්‍ර අළුත්වැඩියා වියදම වූ රු. 4 000 යන්ත්‍ර ගිණුමට හර කර ඇත.

   ඉහත තොරතුරු ඇසුරින් ඔබ විසින්,
      I. වැරදි නිවැරදි කිරීමේ සටහන් පොදු ජර්නලයක සටහන් කරන්න.
      II. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර ශේෂ පිරික්සුමේ වෙනස සොයන්න.

9. සුපුන්ගේ ව්‍යාපාරයේ 2021.06.30 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම අසමාන විය. වෙනසට හේතු පහත දැක්වේ.

   I. රු. 6 000 ක අත්පිට විකුණුම් මුදල් පොතේ පමණක් සටහන් වී ඇත.
   II. ණයහිමියන්ට ගෙවූ රු. 4 000 ක මුදල ණය හිමි ගිණුමේ බැරට සටහන් කර ඇත.
   III. වැටුප් ගිණුමේ රු. 9 000 ක ශේෂය ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.
   IV. රු. 500 ක ලද වට්ටම් දුන් වට්ටම් ලෙස සලකා දුන් වට්ටම් ගිණුමේ සටහන් කර ඇත.
   V. රු. 1 500 ක දුරකථන ගාස්තු ගෙවීම ගිණුම්වල සටහන් වී නැත.

   ඉහත තොරතුරු ඇසුරින්
      I. වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පොදු ජර්නලයේ දක්වන්න.
      II. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර ශේෂ පිරික්සුමේ දැක්වූ වෙනස ගණනය කරන්න.

10. සඳුනිගේ ව්‍යාපාරයේ 2021.09.30 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ වෙනසක් ඇතිවිය. වෙනසට බලපාන ලද පහත කරුණු අනාවරණය විය.

   (1) ණයගැතියෙකුගෙන් ලද රු. 11 000 ක මුදල මුදල්පොතේ සටහන් කර ඇත්තේ රු. 1 100 ලෙසය.
   (2) දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 500 ක් අඩුවෙන් එකතු කර ඇත.
   (3) ණයගැතියෙකුගෙන් ලැබී තැන්පත් කරන ලද රු. 6 000 ක චෙක්පත අගරුවීම පොත්වල වාර්තා කර නැත.
   (4) අයිතිකරුගේ රු. 5 000 ක භාණ්ඩ ගැනිලි මුදල් පොතට බැර කර ගැනිලි ගිණුම නිවැරදිව සටහන් කර ඇත.
   (5) විකුණුම් ගිණුමේ එකතුව වූ රු. 150 000 ශේෂ පිරික්සුමට පිටපත් කර ඇත්තේ රු. 145 000 ක් ලෙසය.

   ඉහත තොරතුරු ඇසුරින්
      I. වැරදි නිවැරදි කිරීමේ සටහන් පොදු ජර්නලයේ දක්වන්න.
      II. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර ශේෂ පිරික්සුමේ දැක්වූ වෙනස ගණනය කරන්න.

11. පහත දැක්වෙන්නේ සෙතගුගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමයි. එහි හර හා බැර තීරුවල එකතුව සමාන නොවූ නිසා වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී.

සෙතගුගේ ව්‍යාපාරය

2021.03.31 දිනට ශේෂ පිරික්සුම

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 200 000 | |
| ලීබඩු | 50 000 | |
| ණයගැතියෝ | 35 000 | |
| ණයහිමියෝ | | 60 000 |
| වැටුප් | 20 000 | |
| රක්ෂණ ගාස්තු | 15 000 | |
| ප්‍රාග්ධනය | | 80 000 |
| බැංකු ණය | | 183 000 |
| බැංකු ණයපොළී | 5 000 | |
| ආයෝජන | 50 000 | |
| ආයෝජන ආදායම් | | 5 000 |
| මුදල් | 60 000 | |
| ගැනුම් | 118 000 | |
| විකුණුම් | | 205 000 |
| අවිනිශ්චිත ගිණුම | | 20 000 |
| | 553 000 | 553 000 |

පසුව ගිණුම් පොත් පරීක්ෂාවේදී පහත වැරදි අනාවරණය විය.

(1) රු. 15 000 ක ලීබඩු අලුත්වැඩියා වියදම ලීබඩු ගිණුමට හර කර ඇත.
(2) රු. 12 000 ක ණයට ගැනුම් අදාළ ණයහිමි ගිණුමේ සටහන් වී නැත.
(3) රු. 8 000 ක වැටුප් ගෙවීම මුදල්පොතේ පමණක් සටහන් වී ඇත.
(4) රු. 4 000 ක ප්‍රචාරණ ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.
(5) රු. 15 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වල වාර්තා කර නැත.
(6) රු. 7 500 ක ණයගැතියන්ගෙන් ලද මුදල මුදල් පොතේ නිවැරදිව සටහන් කර ණයගැති ගිණුමට හර කර ඇත.
(7) ආයෝජන ආදායම් ලෙස ලද රු. 5 000 ක මුදල ආයෝජන ආදායම් ගිණුමේ සටහන් කර නැත.

ඔබ විසින්,

I. ඉහත වැරදි නිවැරදි කිරීමේ සටහන් දක්වන්න.
II. වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න.
III. වැරදි නිවැරදි කිරීමෙන් පසු 2021.03.31 දිනට නිවැරදි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

12. චමින්දගේ ව්‍යාපාරයේ 2021.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූයෙන් එහි වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව වෙනසට හේතු වූ කරුණු සොයා එම වැරදි පොදු ජර්නලයක් මඟින් නිවැරදි කොට ශේෂ පිරික්සුම නිවැරදි කරන ලදී.
එසේ නිවැරදි කරන ලද අවිනිශ්චිත ගිණුම පහත දැක්වේ.

අවිනිශ්චිත ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂ පිරික්සුමේ වෙනස | .................. | | |
| විකුණුම් ගිණුම | 9 000 | උපකරණ ගිණුම | 12 000 |
| රක්ෂණ ගාස්තු ගිණුම | 3 000 | වේතන ගිණුම | 3 000 |
| | | ගැනුම් ගිණුම | 5 000 |
| | | | |

පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ තිබූ වෙනස කොපමණද?

(2) අගය අඩුවෙන් දැක්වෙනුයේ ශේෂ පිරික්සුමේ කුමන තීරුවේද?

(3) අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඇතුළත් කිරීමට පෙර ලෙජරයේ හර ශේෂවල එකතුව රු. 45 500 ක් වූයේ නම් එහි සඳහන්ව තිබූ බැර ශේෂවල එකතුව කොපමණද?

(4) ඉහත ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්වල සිදුවූයේ යැයි අපේක්ෂා කළ හැකි වැරදි 05ක් පෙළගස්වන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව